සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2017 ජූලි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2017-07-16
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයකම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත ටැක් (පෞද්ගලික) සමාගම,** 2016 ජනවාරි 01 දින, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද අතර, එදිනම එහි ව්‍යාපාර කටයුතු අරඹන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) බදු සඳහා වාසිකභාවය තිරණය කිරීමේදී, ශ්‍රී ලංකාවේ සමාගමකට අදාලවන රීතිය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) 2015/16 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත ටැක් (පෞද්ගලික) සමාගමේ** ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ආලෝක (පෞද්ගලික) සමාගම,** ඉලෙක්ට්‍රොනික් උපකරණ විකිණීමේ ව්‍යාපාරයේ නිරතව සිටින සමාගමකි.

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) සමාගමේ පිරිවැටුම පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| සමාගම විසින් ආනයනය කළ භාණ්ඩ විකිණීමෙන් | 4,600,000 |
| සමාගම දේශීයව මිලට ගත් භාණ්ඩ විකිණීමෙන් | 2,340,000 |
| | **6,940,000** |

(2) සමාගම විසින් ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු [Nation Building Tax (NBT)] ප්‍රමාණයන් පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| ආනයනික භාණ්ඩ මත | 32,800 |
| දේශීයව මිලට ගත් භාණ්ඩ මත | 12,500 |

(3) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදුවල මාසික වාරික ලෙස රු.20,000/- ක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්දෙහි ඉතිරි ප්‍රමාණය **තක්සේරු කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සුව දිවි පදනම** රාජ්‍ය නොවන සංවිධානයකි (Non-Governmental Organization - NGO). එය ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින්, සෞඛ්‍යය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි.

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල උධෘතයන් පහතින් දැක්වේ:

| | රු. |
|---|---|
| විදේශ පරිත්‍යාගශීලීන්ගෙන් (foreign donors) ලැබුනු ප්‍රදාන | 1,440,000 |
| ස්ථාවර තැන්පතු මත ලැබූ පොලී ආදායම<br>(8% බැගින් රඳවා ගැනීමේ බදු (WHT) අඩුකර ඇත) | 46,000 |
| සම්පත් දායකයන් (resource persons) සඳහා ගාස්තු | (840,000) |
| පරිපාලන වියදම් | (570,000) |
| **වර්ෂය සඳහා අතිරික්තය** | **76,000** |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2015/16 තක්සේරු වර්ෂය සඳහා, **සුව දිවි පදනමේ** ආදායම් බදු බැදියාව **තක්සේරු කරන්න.** (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**AA පාට්නර්ස් හවුල් ව්‍යාපාරය** කොළඹ ගොඩනැගිලි ද්‍රව්‍ය (hardware items) තොග සහ සිල්ලර වෙළදාමේ නිරත වන අතර, **අහමඩ්, AA පාට්නර්ස්හි හවුල්කරුවෙකි.** ඔහු ඔහුගේ ආදායම් බදු බැදියාව අවම කර ගැනීමේ ක්‍රම කිහිපයක් සලකා බලමින් සිටියි. **AA පාට්නර්ස්හි** ඔහුගේ ලාභ කොටස ඔහුගේ පුතුන් පස්දෙනා අතර බෙදාගැනීමේ ගිවිසුමකට එළඹෙන ලෙස **අහමඩ් ට** ඔහුගේ මිතුරෙකු විසින් උපදෙස් දෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

<u>ඩාවුඩ්බෝයිට එරෙහිව දේශීය ආදායම් කොමසාරිස්</u> (Davoodbhoy Vs CGIR) නඩු තීන්දුව ඇසුරෙන්, බදු අරමුණු සඳහා **අහමඩ්ගේ** මුළු ලාභ කොටසම ඔහුගේ ආදායම ලෙස සැළකිය හැකිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත රෝසි (පෞද්ගලික) සමාගම,** සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයේ නිරත වනු ලබන එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

(1) විකුණුම් [එකතු කළ අගය මත බදු (VAT) **රහිතව**]:

| | |
|---|---|
| සෘජු අපනයන [ඇමරිකානු ඩොලර් (USD) 1 = රු.150/-] | ඇමරිකානු ඩොලර් 14,500/- |
| දේශීය ගනුදෙනුකරුවන්ට විකුණුම් | රු.5,325,000/- |

(2) ඉවත් කරන ලද පරිගණක විකිණීමෙන් ලද ආදායම රු.300,000/- කි.

(3) ගෙවූ එකතු කළ අගය මත යෙදවුම් බදු (Input VAT):

| | රු. |
|---|---|
| ආනයනික අමුද්‍රව්‍ය මත | 636,000 |
| දේශීය ගැනුම් මත | 244,000 |
| ප්‍රධාන විධායක නිලධාරියා භාවිත කරන ලද මෝටර් රථයේ රක්ෂණ වාරිකය මත | 42,000 |

(4) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන ආ වැඩිපුර ගෙවූ එකතුකළ අගය මත යෙදවුම් බද්ද රු.24,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / වැඩිපුර ගෙවූ (overpaid) එකතු කළ අගය මත බද්ද (VAT) **තක්සේරු කරන්න**. (ලකුණු 10)

### 06 වන ප්‍රශ්නය

ටින් මාළු නිපදවීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ නිරත, **සීමාසහිත සයුරු නිෂ්පාදිත (පෞද්ගලික) සමාගමේ,** පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත:

(1) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර:

| | 2014.04.01 දිනට ධාරණ අගය (ශුද්ධ පොත් අගය) (රු.) | වර්ෂය තුළ එකතු කිරීම් (රු.) | වර්ෂය සඳහා ක්ෂය (රු.) | 2015.03.31 දිනට ධාරණ අගය (ශුද්ධ පොත් අගය) (රු.) |
|---|---|---|---|---|
| ඉඩම | - | 1,000,000 | - | 1,000,000 |
| ගොඩනැගිලි | 2,650,000 | - | 265,000 | 2,385,000 |
| පරිගණක | 525,000 | 345,400 | 131,250 | 739,150 |
| උපකරණ | 236,000 | 155,000 | 35,400 | 355,600 |
| යන්ත්‍ර | 2,430,000 | - | 303,750 | 2,126,250 |
| මෝටර් රථ | - | 1,600,000 | - | 1,600,000 |
| | **5,841,000** | **3,100,400** | **735,400** | **8,206,000** |

සමාගමේ ප්‍රතිපත්තියට අනුව, වත්කම් මිලදී ගත් වර්ෂයේදී ක්ෂය අය නොකරයි.

(2) 2014/15 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීමේ සාරාංශය:

| | රු. |
|---|---|
| බදු පෙර ලාභය | 15,678,000 |
| එකතු කළා: ඉඩ නොදෙන වියදම් | 6,520,000 |
| අඩු කළා: ඉඩදෙන වියදම් | 4,563,000 |
| බදු සඳහා ගලපන ලද ලාභය | 17,635,000 |
| **ගෙවිය යුතු දළ ආදායම් බද්ද** | **4,937,800** |

(3) සමාගම, 2015 ජනවාරි 31 දින, 2014/15 තක්සේරු වර්ෂයේ ලාභයෙන්, රු.500,000/- ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) 2014/15 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ බෙදාහැරිය හැකි ලාභය. (ලකුණු 05)

(b) 2015/16 තක්සේරු වර්ෂය සඳහා බෙදාහැරිය හැකි ලාභය මත බදු [tax on distributable profits (Deemed Dividend Tax)] නොගෙවා සිටීමට බෙදාහැරිය යුතු අවම ලාභාංශ ප්‍රමාණය. (ලකුණු 02)

(c) 2015/16 තක්සේරු වර්ෂය සඳහා බෙදාහැරිය හැකි ලාභ මත බද්ද. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**මොඩන් ලුක්,** නිමි ඇඳුම් අයිතම ආනයනය කර විකිණීමේ නිරත හවුල් ව්‍යාපාරයකි. **මොඩන් ලුක්** හි හවුල්කරුවන් වන **ඩේවිඩ්** සහ **එඩ්වඩ්** ලාභා'ලාභ සමසමව බෙදාගැනීමටත්, හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාරයට සපයන ලද අරමුදල් සඳහා 5% බැගින් පොලියක් ලබා ගැනීමටත් එකඟ වූහ. 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය පහත දී ඇත:

| | රු. |
|---|---|
| පිරිවැටුම | 12,380,940 |
| විකුණුම් පිරිවැය | (7,780,000) |
| **දළ ලාභය** | **4,600,940** |
| සේවක වැටුප් | (540,000) |
| වත්කම් මත ක්ෂය | (236,000) |
| උපයෝගිතා සේවා බිල්පත් | (45,000) |
| **ඩේවිඩ්** විසින් ලබාදුන් ණය සඳහා පොලිය | (56,000) |
| ලිපිද්‍රව්‍ය | (12,000) |
| **ශුද්ධ ලාභය** | **3,711,940** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) **ඩේවිඩ්ගේ** බිරිඳ වන **රෝස්, මොඩන් ලුක්** හි පරිපාලන නිලධාරිනිය වශයෙන් සේවය කරන අතර, **රෝස්ගේ** මාසික වැටුප රු.20,000/- කි. සේවක වැටුප්වල **රෝස්** ට ගෙවන ලද වැටුප වූ රු.240,000/- ඇතුළත් වේ.

(2) 2015/16 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා වත්කම් මත ක්ෂය දීමනාව රු.96,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) හවුල් ව්‍යාපාරයේ ආදායම් බදු බැඳියාව **ගණනය කරන්න**. (ලකුණු 02)

(c) හවුල් ව්‍යාපාරයෙන් පැන නගින ලාභ සහ වෙනත් ආදායම් හවුල්කරුවන් අතර බෙදාහැරීමේ ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

2000 වර්ෂයේදී සංස්ථාපනය කරන ලද වාසික සමාගමක් වන **සීමාසහිත රිචි ෆුඩ් (පෞද්ගලික) සමාගම** දේශීය වෙළෙඳපොළ සඳහා බිස්කට් නිෂ්පාදනය කිරීමේ සහ විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටියි. සමාගම, **සීමාසහිත ස්ටාර් පොදු සමාගමෙහි** පරිපාලිත සමාගමක් වේ. 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත රිචි ෆුඩ් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

(1) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාරාංශගත ආදායම් ප්‍රකාශය පහත දැක්වේ:

| | රු. |
|---|---|
| පිරිවැටුම - දේශීය විකුණුම් | 538,310,000 |
| විකුණුම් පිරිවැය | (290,687,200) |
| **දළ ලාභය** | **247,622,800** |
| **වෙනත් ආදායම්:** | |
| යන්ත්‍රය විකිණීම මත ලාභය | 340,000 |
| ලද ලාභාංශ - ශුද්ධ | 108,000 |
| පරිපාලන වියදම් | (94,776,000) |
| බෙදාහැරීමේ වියදම් | (24,650,000) |
| මූල්‍ය වියදම් | (8,549,000) |
| **බදුවලට පෙර ලාභය** | **120,095,800** |

(2) පරිපාලන වියදම් තුළ පහත දෑ ඇතුලත් වේ:

- **සීමාසහිත ස්ටාර් පොදු සමාගම** වෙත ගෙවූ කළමනාකරණ ගාස්තුව රු.4,036,000/- කි.
- අවතැන් වූ වැඩිහිටියන්ට ආයතනිකමය රැකවරණය සැපයීම සඳහා පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයකට කළ මුදල් පරිත්‍යාගය රු.1,000,000/- කි.
- සේවකයෙකුගෙන් ලැබිය යුතු රු.75,000/- ක ශේෂයක් ලියාහැර තිබේ. ඊට අමතරව, සමාගම ණයගැතියන්ගෙන් අඩමාණ ණය සඳහා රු.25,000/- ක පොදු වෙන්කිරීමක් කර ඇත.
- වර්ෂය සඳහා පාරිතෝෂික සඳහා වෙන්කිරීම රු.543,000/- කි.
- 2014 ජුලි 01 දින සමාගම වර්ෂ 5 ක කාලසීමාවක් සඳහා කුලී ගිවිසුමකට එළඹ ඇත. මාසික කුලිය රු.26,000/- ක් වන අතර වර්ෂය සඳහා කුලිය ආදායම් ප්‍රකාශයට අයකර ඇත.

(3) බෙදාහැරීමේ වියදම් තුළ පහත දෑ ඇතුලත් වේ:

- මුළු ප්‍රචාරණ පිරිවැය රු.760,000/- කි. එයින් රු.500,000/- ක් විදේශීය ගනුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතදී දරා ඇත.
- සංග්‍රහ වියදම් රු.265,500/- ක් වූ අතර එය දරා ඇත්තේ ව්‍යාපාරික කටයුතු කතිකා කර ගැනීම සඳහා පැමිණි ගනුදෙනුකරුවන්ට සංග්‍රහ කිරීමටයි.

(4) බදු බැර අයකිරීම සඳහා ඉල්ලා සිටිය හැකි කාලසීමාව (claimable period) ඉකුත්වීම නිසා ලියාහරින ලද ආර්ථික සේවා ගාස්තුව වන රු.4,000,000/- මූල්‍ය වියදම් තුළ ඇතුලත් වේ.

(5) අනෙකුත් සියලු වියදම්, ආදායම් බදු අරමුණු සඳහා ඉඩදෙනු ලැබේ.

(6) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

**පිරිවැය**

| විස්තර | 2015 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් (රු.) | ඉවත් කිරීම් (රු.) | 2016 මාර්තු 31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල | 15,000,000 | - | - | 15,000,000 |
| යන්ත්‍රෝපකරණ | 21,500,000 | 4,675,000 | (3,850,000) | 22,325,000 |
| පරිගණක | 1,450,000 | 320,000 | - | 1,770,000 |
| මෝටර් වාහන | 5,650,000 | 2,600,000 | - | 8,250,000 |
| ලී බඩු | 1,240,000 | 124,000 | - | 1,364,000 |
| **එකතුව** | **44,840,000** | **7,719,000** | **(3,850,000)** | **48,709,000** |

**ක්ෂය කිරීම්**

| විස්තර | 2015 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.) | වර්ෂය සඳහා අයකිරීම (රු.) | ඉවත් කිරීම් (රු.) | 2016 මාර්තු 31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල | 6,750,000 | 750,000 | - | 7,500,000 |
| යන්ත්‍රෝපකරණ | 10,750,000 | 2,232,500 | (1,540,000) | 11,442,500 |
| පරිගණක | 1,015,000 | 354,000 | - | 1,369,000 |
| මෝටර් වාහන | 2,542,500 | 1,237,500 | - | 3,780,000 |
| ලී බඩු | 1,116,000 | 136,400 | - | 1,252,400 |
| **එකතුව** | **22,173,500** | **4,710,400** | **(1,540,000)** | **25,343,900** |

(7) සමාගම විසින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කළ යන්ත්‍රයක් වර්ෂය තුළදී විකුණන ලදී. මෙම යන්ත්‍රය, 2011 මැයි මාසයේදී රු.3,850,000/- කට මිලට ගෙන තිබුණි. පැරණි යන්ත්‍රය ප්‍රතිස්ථාපනය සඳහා නව යන්ත්‍රයක් මිලට ගැනීමට සම්පූර්ණ විකුණුම් මුදලම භාවිත කරන ලදී.

(8) මෝටර් වාහනවලට එකතුකිරීම්වල පෙන්නුම් කරන්නේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භාවිතය සඳහා මිලට ගත් කාර් රථයකි.

(9) ගොඩනැගිල්ල සහ විකුණන ලද යන්ත්‍රය හැර, 2015 අප්‍රේල් 01 දිනට පැවති වත්කම් වෙනුවෙන් බදු අරමුණු සඳහා ක්ෂය දීමනාව සම්පූර්ණයෙන් හිමිකරගෙන තිබුණි. ගොඩනැගිල්ල ඉදිකරන ලද්දේ 2005 මැයි මාසයේදීය.

(10) වර්ෂය තුළදී පාරිතෝෂික සඳහා ගෙවීම් කර නොතිබුණි.

(11) 2015/16 තක්සේරු වර්ෂය සඳහා ස්වතක්සේරු පදනම මත ගෙවූ ආදායම් බද්ද රු.12,000,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2015/16 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(b) තක්සේරු කළ හැකි ආදායම,

(c) බදු අයකළ හැකි ආදායම,

(d) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(e) ගෙවිය යුතු ඉතිරි බද්ද.

***සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **රම්‍යා**, මූල්‍ය සමාගමක ප්‍රධාන නීති නිලධාරිණිය වශයෙන් සේවය කරයි. ඇය 2012 වර්ෂයේදී ඇයගේ ස්වාමිපුරුෂයාගෙන් දික්කසාද වූ අතර, 2006 ජූනි 29 වන දින උපන් ඔවුන්ගේ දියණිය වන **සතුති**, ඇය සමග ජීවත් වන අතර, ඇය විසින් රැකබලා ගනු ලබයි. 2015/16 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **රම්‍යා** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත.

(1) මාසයකට රු.200,000/- ක දළ වැටුපක් ඇයට ලැබී තිබුණි.

(2) ඇගේ රාජකාරි සහ පෞද්ගලික පාවිච්චිය වෙනුවෙන් මෝටර් කාර් රථයක් (1,300 CC) රියැදුරු සහ ඉන්ධන සමග ඇයට ලබාදී ඇති අතර, පෞද්ගලික පාවිච්චිය වෙනුවෙන් ඇය සේවායෝජකයාට ගෙවීමක් නොකළාය. සමාගම, මෙම රථය සඳහා ධාවන වාර්තා පවත්වා නොගනී.

(3) ඇගේ ජංගම දුරකතන බිල්පත් සමාගම විසින් දරණු ලබන අතර, වර්ෂය තුළදී රු.32,000/- ක් ප්‍රතිපූරණය කර ඇත.

(4) සමාගමේ වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇති අතර, ඇගේ දියණියගේ වෛද්‍ය වියදම් වෙනුවෙන් වර්ෂය තුළදී රු.140,000/- ක මුදලක් සමාගම ප්‍රතිපූරණය කර ඇත.

(5) වර්ෂය සඳහා අඩුකරන ලද උපයනවිට ගෙවීමේ බද්ද (PAYE) රු.168,960/- කි.

(6) දියණිය සමග ඇය වාසය කරන්නේ ඇය විසින් මිලට ගත් තට්ටු නිවාසයක (an apartment) යි. එම තට්ටු නිවාසයේ වරිපනම් තක්සේරුව රු.240,000/- ක් වන අතර 30% බැගින් වරිපනම් ගෙවයි.

(7) ඇගේ මියගිය පියාගෙන් **රම්‍යාට** ත්‍යාගයක් වශයෙන් ලැබුනු නිවස රු.35,000/- ක මාසික කුලියකට කුලියට දී ඇත. වර්ෂය තුළදී **රම්‍යා** විසින් දරණ ලද අළුත්වැඩියා පිරිවැය රු.265,000/- කි. වරිපනම් තක්සේරුව රු.160,000/- ක් වන අතර 20% බැගින් වරිපනම් ගෙවයි.

(8) ස්ථාවර තැන්පතුවක් මත වර්ෂය සඳහා ලද පොලිය රු.250,000/- ක් වන අතර, 2.5% බැගින් පොලිය මත රඳවාගැනීමේ බදු අඩුකර ඇත.

(9) **සතුති** ට බාලවයස්කාර ඉතිරිකිරීමේ ගිණුමක් ඇති අතර, වර්ෂය සඳහා රු.18,000/- ක පොලී ආදායමක් ඇයට ලැබී ඇත.

(10) **රම්‍යා,** රු.100,000/- ක ණය මුදලක් මිතුරියකට දී ඇති අතර, වර්ෂය තුළදී ණය ආපසු ගෙවීම වශයෙන් රු.120,000/- ක මුදලක් ඇයට ලැබී ඇත.

(11) වර්ෂය තුළදී රු.400,000/- ක මුදල් ත්‍යාගයක් ලොතරැයියකින් ඇය ජයග්‍රහණය කළාය. ලොතරැයි ත්‍යාගයෙන් රු.50,000/- ක් "අපි වෙනුවෙන් අපි" අරමුදලට පරිත්‍යාග කරන ලදී.

(12) කුලියට දී ඇති නිවස අළුත්වැඩියා කිරීම සඳහා **රම්‍යා** ඇගේ බැංකුවෙන් රු.200,000/- ක ණය මුදලක් ලබාගෙන ඇත. වර්ෂය තුළදී පොලිය සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම වශයෙන් පිළිවෙලින් රු.22,250/- ක් සහ රු.75,750/- ක් ඇය ගෙවා ඇත.

(13) කොළඹ ජාතික රෝහලේ වාට්ටුවක තීන්ත ආලේප කිරීම සඳහා රු.50,000/- ක් වටිනා තීන්ත ඇය පරිත්‍යාග කර ඇත.

(14) ස්ව-තක්සේරු (self-assessment) පදනම මත ගෙවූ බද්ද රු.20,000/- කි.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2015/16 තක්සේරු වර්ෂය සඳහා **රම්‍යාගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**.

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |